# උතුරු පළාත් රාජ්‍ය සේවයේ කර්මාන්ත ක්ෂේත්‍ර දෙපාර්තමේන්තුව යටතේ පවතින තනතුරුවලට බඳවා ගැනීම සඳහා විවෘත හා සීමිත තරඟ විභාගය - 2018

උතුරු පළාත් සභාවේ කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ පවතින පහත සඳහන් **වගුව – I** හි සඳහන් කර ඇති තනතුරු පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට විවෘත තරඟ විභාගය උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්තුමා විසින් **2018 නොවැම්බර් මාසය** වන විට යාපනයේදී පැවැත්වීමට නියමිත බව මෙයින් දැනුම් දෙනු ලැබේ. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය **19.10.2018** වේ.

- **වගුව – I**

| අංක | විභාගයේ නම | විභාග අංක | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | උතුරු පළාත් රාජ්‍ය සේවයේ පේෂකර්ම උපදේශක III වන ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම සඳහා විවෘත තරඟ විභාගය – 2018 | I | 10 |
| 02 | උතුරු පළාත් රාජ්‍ය සේවයේ පේෂකර්ම උපදේශක III වන ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම සඳහා සීමිත තරඟ විභාගය – 2018 | II | |
| 03 | උතුරු පළාත් රාජ්‍ය සේවයේ කුඩා අත් කර්මාන්ත උපදේශක III වන ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම සඳහා විවෘත තරඟ විභාගය – 2018 | III | 14 |
| 04 | උතුරු පළාත් රාජ්‍ය සේවයේ කුඩා අත් කර්මාන්ත උපදේශක III වන ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම සඳහා සීමිත තරඟ විභාගය – 2018 | IV | |
| 05 | උතුරු පළාත් රාජ්‍ය සේවයේ අලෙවි කළමනාකරු තනතුරේ III වන ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා විවෘත තරඟ විභාගය – 2018 | V | 01 |
| 06 | උතුරු පළාත් රාජ්‍ය සේවයේ නිර්මාණකරණ සේවය III වන ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය – 2018 | VI | 01 |

## 02. බඳවා ගැනීමේ සේවා කොන්දේසි :-

02.1 උතුරු පළාත් ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද **වගුව – I** හි පෙන්වා ඇති තනතුරුවලට අදාළ සේවා ව්‍යවස්ථා සංග්‍රහය / බඳවා ගැනීම් ක්‍රමයේ නිර්දේශිත කොන්දේසීන්, ආයතන සංග්‍රහයේ විධිවිධානයන්, මුදල් රෙගුලාසීන් හා ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අංක **1817/30** දරණ **2013.07.03** වැනි දිනැති අති විශේෂ ගැසට් නිවේදනයේ පළකරන ලද උතුරු පළාත් රාජ්‍ය සේවය සඳහා ආයතන ක්‍රියා පරිපාටිය රෙගුලාසීන්ටත් බඳවා ගැනීම් කාල පරිච්ඡේදය තුළ සිදුකරන්නා වූ යම්කිසි සංශෝධනයන්ද ඇතුළුව තෝරාගන්නා විභාග අපේක්ෂකයන් **වගුව – I** හි දක්වා ඇති තනතුරුවල III වන ශ්‍රේණියට පත්කරනු ලැබේ.

02.2 විවෘත තරඟ විභාගය මඟින් පත්වීම් සඳහා තෝරාගත් විභාග අපේක්ෂකයන් පත්වීම් දින සිට වසර තුනකට (03) පරිවාස කාලයට යටත්ව හා සීමිත තරඟ විභාගය මඟින් පත්වීම සඳහා සුදුසුකම් ලබන අපේක්ෂකයන් පත්වීම් දින සිට වසරක කාලයකට වැඩබලන පරිවාස කාලයට යටත්ව III වන ශ්‍රේණියේ තනතුරට පත් කරනු ලැබේ. මෙම තනතුර ස්ථිරය විශ්‍රාම වැටුප් හිමි තනතුරකි. සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් කර ඇති පරිදි උක්ත වගුවේ **– I** හි සඳහන් තනතුරුවල III වන ශ්‍රේණියට බඳවා ගනු ලැබූ දින සිට වසර තුනක (03) කාල පරිච්ඡේදය තුළ පළමු කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුතුයි.

02.3 මෙම සේවාවන් ස්ථාන මාරු සහිත සේවාවන් වේ. එබැවින් මෙම පත්වීම් ලබන්නන් උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතුයි යන කොන්දේසියට අවනත විය යුතුයි.

02.4 එක් සේවා ස්ථානයක පත්වීම් ලබන්නන්, එම සේවා ස්ථානයේ අවම වශයෙන් අවුරුදු පහක් (05) අඛණ්ඩව සේවය කිරීම අත්‍යාවශ්‍ය කොන්දේසියක් වේ.

02.5 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 හා මේ සම්බන්ධයෙන් හා එයට සමගාමීව නිකුත් කරනු ලබන චක්‍රලේඛයන් පරිදි ද පත්වීම් දින සිට වසර පහක් (05) අවසන් වීමට ප්‍රථම නියම කරන ලද දෙවන රාජ්‍ය භාෂාව සමත්විය යුතුයි.

02.6 පත්වීම් සංඛ්‍යාව හා පත්වීම් ක්‍රියාත්මක වන දිනය පත්වීම් බලධාරියා විසින් නිර්වචනය. පත් කිරීමට නියමිත ගණන **වගුව – I** හි දක්වා ඇති පරිදිවේ. කෙසේ නමුත් දන්වා ඇති පුරප්පාඩු සම්බන්ධයෙන් පුරප්පාඩු කිහිපයක් හෝ පුරප්පාඩු සියල්ල පූර්ණය නොකිරීමේ බලය පත්වීම් බලධාරියා සතුය.

**03. වැටුප් පරිමාණය :-**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 පරිදි, වැටුප් කාණ්ඩය **MN 1 - 2016** යට අනුව **වගුව - I** හි සඳහන් තනතුරුවල - III ශ්‍රේණිය සඳහා ඒකාබද්ධ වැටුප් අනුපාතය **රු. 27,140 – 10 x 300 - 11 x 350 - 10 x 495 – 10 x 660 – 45,540/-** ක් වේ. (රුපියල් 28,040 වැටුප් පියවරට ප්‍රථම කාර්යක්ෂමතා කඩඉම සමත්වී සිටිය යුතුයි) කෙසේ වෙතත් ඉහත චක්‍රලේඛයේ II වන වගුවේ සඳහන් පරිදි විධිවිධානයන්ට අනුකූලව වැටුප් ගෙවනු ලැබේ.

**04. සාමාන්‍ය සුදුසුකම් :-**

04.1 අයදුම්කරු ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුයි.

04.2 අයදුම්කරු උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක වුවද සේවය කිරීමට යෝග්‍ය වන පරිදි ශාරීරික වශයෙන් නිරෝගීමත් විය යුතු අතර මනා චරිතයකින් හෙබි පුද්ගලයෙකු විය යුතුයි.

04.3 අ) අයදුම්කරු උතුරු පළාත තම ස්ථිර පදිංචි ස්ථානය කොටගත් කෙනෙකු විය යුතුයි. මෙම අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට ප්‍රථම වසර හයක (06) කාල පරිච්ඡේදය තුළ අවම වශයෙන් වසර තුනක් (03) හෝ උතුරු පළාතේ අඛණ්ඩ පදිංචිකරුවෙකු විය යුතුයි.

**නැතිනම්**

ආ) අයදුම්කරු හෝ දෙමාපියන් උතුරු පළාත උපන් ස්ථානය කොටගත් හා අවම වශයෙන් වසර පහක් (05) උතුරු පළාතේ අඛණ්ඩව පදිංචිවී සිටිය යුතුයි (*සම්මුඛ පරීක්ෂණයේ දී තම ඡන්ද ලැයිස්තුවේ සහතික කරන ලද පිටපත ඉදිරිපත් කළ යුතුයි)

04.4 අයදුම්පත භාර ගන්නා අවසන් දිනට හෝ ඊට ප්‍රථම මෙම තනතුර සඳහා කැඳවන ලද **සියළුම සුදුසුකම්** අපේක්ෂකයා විසින් සපුරා තිබිය යුතුයි.

**05. අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම් :-**

**05.1 පේෂකර්ම උපදේශක III වන ශ්‍රේණියට විවෘත තරග විභාගය මගින් බඳවා ගැනීම**

**විභාග අංක - I**

**(අ) අධ්‍යාපන සුදුසුකම් :-**

අපොස (සා/පෙ) විභාගයෙන් **එකවර** භාෂාව (දෙමළ / සිංහල), ගණිතය යන විෂයයන් ඇතුළු විෂයයන් හතරකට (04) සම්මාන සමාර්ථයන් ඇතුළුව විෂයයන් හයක් (06) සමත්වී තිබිය යුතුයි.

**හා**

අපොස (උ/පෙ) විභාගයෙන් අවම වශයෙන් විෂයයන් එකක් සමත් වී තිබිය යුතුයි. (පොදු විභාගය හැර)

**(ආ) වෘත්තීය අධ්‍යාපනය / වෘත්තීමය සුදුසුකම් :-**

01. විවීම් ශිල්පීකරණය සම්බන්ධයෙන් ඇඟළුම් කර්මාන්ත දෙපාර්තමේන්තුවේ අවසන් පරීක්ෂණයෙන් සම්මාන සමාර්ථය සමඟ සහතිකයක් හිමි කර තිබිය යුතුයි. (ඇඟළුම් දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද වසරක පුහුණු පාඨමාලාව)

**හෝ**

ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම (N.V.Q Level) සහතික 02 / 03 - පේෂකර්ම / ඇඟළුම් කර්මාන්තය

02. බඳවා ගන්නා අවස්ථාවේදී පවතින පුරප්පාඩුවල ගණනට සුදුසුකම්ලත් අපේක්ෂකයන්ගේ සංඛ්‍යාව අඩුවෙන් දක්නට ලැබේ නම් බඳවා ගැනීමේ අරමුණ උදෙසා පහත සඳහන් පේෂ කර්ම සම්බන්ධ සහතික අතිරේක සුදුසුකම් ලෙස අවධානයට ලක් කරනු ලැබේ.

   (i) රජයේ ලලිතකලා ආයතනයෙන් ප්‍රදානය කරන ලද ඉහළ තත්ව සහතිකයක්.
   (ii) වානිජ පේෂකර්ම ආයතනය විසින් / කර්මාන්ත කටයුතු දෙපාර්තමේන්තුව විසින් ප්‍රදානය කරන සහතිකයක්.
   (iii) පේෂකර්ම මධ්‍යස්ථානයකින් වසරක විවීම්කරු වශයෙන් සේවය කළ අත්දැකීම් ඇති බවට කර්මාන්ත කටයුතු දෙපාර්තමේන්තුවෙන් ප්‍රදානය කරන ලද සහතියක්.

**(ඉ) වයස්සීමාව :-**

අයදුම්පත භාරගන්නා අවසන් දිනට අයදුම්කරු වයස අවුරුදු 18 **නොඅඩු, හා වයස අවුරුදු** 30 **නොවැඩි** අයෙකු විය යුතුයි.

## 05.2 **පේෂකර්ම උපදේශක III වන ශ්‍රේණියට සීමිත තරඟ විභාගය මගින් බඳවා ගැනීම**

**විභාග අංක - II**

**(අ) අධ්‍යාපන සුදුසුකම් :-**

අ.පො.ස (සා/පෙ) විභාගයෙන් **දෙවරකට නොවැඩි වාර ගනකදී** අවම වශයෙන් විෂයයන් (02) කකට සම්මාන සමාර්ථයන් සමඟ විෂයයන් හයක් (06) සමත් වී තිබිය යුතුයි.

**(ආ) වෘත්තීය අධ්‍යාපනය / වෘත්තීමය සුදුසුකම් :-**

විවීම් ශිනුම්කරණය සම්බන්ධයෙන් ඇඟළුම් කර්මාන්ත දෙපාර්තමේන්තුවේ අවසන් පරීක්ෂණයෙන් සම්මාන සමාර්ථය සමඟ සහතිකයක් හිමි කර තිබිය යුතුයි. (ඇඟළුම් දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද වසරක පුහුණු පාඨමාලාව)

**සටහන :-**

බඳවා ගන්නා අවස්ථාවේදී මෙම තනතුරට සුදුසු අපේක්ෂකයන්ගේ ගණන පුරප්පාඩු සංඛ්‍යාවට වඩා අධිකව දක්නට ලැබේ නම් බඳවා ගැනීමට පහත සඳහන් පේෂකර්ම සම්බන්ධ සහතික ද අවධානයට යොමු කරනු ලැබේ.

(i) රජයේ ලලිත කලා ආයතනයකින් ප්‍රදානය කරන ලද ඉහළ තත්ව සහතිකයක්.

(ii) වානිජ පේෂකර්ම ආයතනය විසින්/ කර්මාන්ත කටයුතු දෙපාර්තමේන්තුව විසින් ප්‍රදානය කරන සහතිකයක්.

(iii) පේෂකර්ම මධ්‍යස්ථානයක වසරක විවීම්කරු වශයෙන් සේවය කළ අත්දැකීම් ඇති බවට කර්මාන්ත කටයුතු දෙපාර්තමේන්තුවෙන් ප්‍රදානය කරන ලද සහතියක්.

**ඒ සමඟම**

**(ඉ) අත්දැකීම් :-**

අත්කර්මාන්ත අංශයෙන් ස්ථිර පත්වීමක අවම වශයෙන් වසර පහක් (05) අඛණ්ඩ හ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුයි. එයට සරිලනසේ එම දිනය අදාළ සේවා සහතික දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුයි.

**(ඊ) වයස් සීමාව :-**

සීමිත තරඟ විභාගයට අයදුම් කළ අයදුම්කරුවන්ගේ උපරිම වයස්සීමාව අදාළ නොවේ.

## 05.3 **කුඩා අත්කර්මාන්ත උපදේශක III වන ශ්‍රේණියේ තනතුර සඳහා විවෘත තරඟ විභාගයක් මගින් බඳවා ගැනීම**

**විභාග අංක - III**

**(අ) අධ්‍යාපන සුදුසුකම් :-**

අපොස (සා/පෙ) විභාගයෙන් **එකවර** භාෂාව (දෙමළ / සිංහල), ගණිතය යන විෂයයන් ඇතුළු විෂයයන් හතරකට (04) සම්මාන සමාර්ථයන් ඇතුළුව විෂයයන් හයක් (06) සමත්වී තිබිය යුතුයි.

**ඒ සමඟ**

අපොස (උ/පෙ) විභාගයෙන් අවම වශයෙන් විෂයයන් එකක් සමත් වී තිබිය යුතුයි. (පොදු විභාගය හැර)

**(ආ) වෘත්තීය අධ්‍යාපනය / වෘත්තීමය සුදුසුකම් :-**

අයදුම්කරු පහත සඳහන් ක්ෂේත්‍රයේ වසරකට නොඅඩු රාජකාරී අත්දැකීම් ලබා තිබිය යුතුයි. (කුඹල්, වඩුකාර්මික, කොහු වැඩ, ගඩොල්කැට වැඩ, ජලනල සවිකිරීම, විද්‍යුත් තාක්ෂණය, ඇලුමිනියම් ඉදිකිරීම, පරිගණක දෘඩාංග, යාන්ත්‍රික ඉංජිනේරු වැනි) ඒ සමඟම අයදුම්කරු විසින් වෘත්තිය සුදුසුකම් වන (N.V.Q) මට්ටම - 03 සම්පූර්ණ කර තිබිය යුතුයි.

**හෝ**

අයදුම්කරු විසින් අදාළ ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම් (N.V.Q) මට්ටම - 04 සම්පූර්ණ කර තිබිය යුතුයි. (කුඹල්, වඩුකාර්මික, කොහු වැඩ, ගඩොල්කැට වැඩ, ජලනල සවිකිරීම, විද්‍යුත් තාක්ෂණය, ඇලුමිනියම් ඉදිකිරීම, පරිගණක දෘඩාංග, යාන්ත්‍රික ඉංජිනේරු වැනි)

**හෝ**

අයදුම්කරු පහත සඳහන් ක්ෂේත්‍රයේ වසරකට නොඅඩු රාජකාරි අත්දැකීම් ලබා තිබිය යුතුයි. (කුඹල්, වඩුකාර්මික, කොහු වැඩ, ගඩොල්කැට වැඩ, ජලනල සවිකිරීම, විද්‍යුත් තාක්ෂණය, ඇලුමිනියම් ඉදිකිරීම, පරිගණක දෘඩාංග, යාන්ත්‍රික ඉංජිනේරු වැනි) ඒ සමඟම අයදුම්කරු විසින් කර්මාන්ත දෙපාර්තමේන්තුවෙන් පවත්වනු ලබන මාස තුනකට නොඅඩු පුහුණු පාඨමාලාව සම්පූර්ණ කර තිබිය යුතුයි.

**(ඉ) වයස් සීමාව :-**

අයදුම්පත භාරගන්නා අවසන් දිනට අයදුම්කරු වයස අවුරුදු 18 **නොඅඩු, හා වයස අවුරුදු 30 නොවැඩි** අයෙකු විය යුතුයි.

## 05.4 කුඩා අත්කර්මාන්ත උපදේශක III වන ශ්‍රේණියේ තනතුර සඳහා සීමිත තරඟ විභාගයක් මගින් බඳවා ගැනීම

**විභාග අංක - IV**

**(අ) අධ්‍යාපන සුදුසුකම් :-**

අපොස (සා/පෙ) විභාගයෙන් **දෙවරකට නොවැඩි වාර ගනකදී** අවම වශයෙන් විෂයය (02) කට සම්මාන සමාර්ථයන් සමඟ විෂයන් හයක් (06) සමත් වී තිබිය යුතුයි.

**(ආ) වෘත්තීය අධ්‍යාපනය / වෘත්තීමය සුදුසුකම් :-**

අයදුම්කරු පහත සඳහන් ක්ෂේත්‍රයේ වසරකට නොඅඩු රාජකාරි අත්දැකීම් ලබා තිබිය යුතුයි. (කුඹල්, වඩුකාර්මික, කොහු වැඩ, ගඩොල්කැට වැඩ, ජලනල සවිකිරීම, විද්‍යුත් තාක්ෂණය, ඇලුමිනියම් ඉදිකිරීම, පරිගණක දෘඩාංග, යාන්ත්‍රික ඉංජිනේරු වැනි) ඒ සමඟම අයදුම්කරු විසින් වෘත්තීය සුදුසුකම් වන (N.V.Q) මට්ටම - 03 සම්පූර්ණ කර තිබිය යුතුයි.

**හෝ**

අයදුම්කරු විසින් අදාළ ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම් (N.V.Q) මට්ටම - 04 සම්පූර්ණ කර තිබිය යුතුයි. (කුඹල්, වඩුකාර්මික, කොහු වැඩ, ගඩොල්කැට වැඩ, ජලනල සවිකිරීම, විද්‍යුත් තාක්ෂණය, ඇලුමිනියම් ඉදිකිරීම, පරිගණක දෘඩාංග, යාන්ත්‍රික ඉංජිනේරු වැනි)

**හෝ**

අයදුම්කරු පහත සඳහන් ක්ෂේත්‍රයේ වසරකට නොඅඩු රාජකාරි අත්දැකීම් ලබා තිබිය යුතුයි. (කුඹල්, වඩුකාර්මික, කොහු වැඩ, ගඩොල්කැට වැඩ, ජලනල සවිකිරීම, විද්‍යුත් තාක්ෂණය, ඇලුමිනියම් ඉදිකිරීම, පරිගණක දෘඩාංග, යාන්ත්‍රික ඉංජිනේරු වැනි) ඒ සමඟම අයදුම්කරු විසින් කර්මාන්ත දෙපාර්තමේන්තුවෙන් පවත්වනු ලබන මාස තුනකට නොඅඩු පුහුණු පාඨමාලාව සම්පූර්ණ කර තිබිය යුතුයි.

**(ඉ) අත්දැකීම් :-**

අත්කර්මාන්ත අංශයෙන් ස්ථිර පත්වීමක අවම වශයෙන් වසර පහක් (05) අඛණ්ඩ හ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුයි. එයට සරිලනසේ එම දිනය අදාළ සේවා සහතික දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුයි.

**(ඊ) වයස් සීමාව :-**

සීමිත තරඟ විභාගයට අයදුම් කළ අයදුම්කරුවන්ගේ උපරිම වයස්සීමාව අදාළ නොවේ.

## 05.5 අලෙවි කළමණාකරු III වන ශ්‍රේණියට විවෘත තරඟ විභාගය මගින් බඳවා ගැනීම

**විභාග අංක - V**

**(අ) අධ්‍යාපන සුදුසුකම් :-**

අපොස (සා/පෙ) විභාගයෙන් **එකවර** භාෂාව (දෙමළ / සිංහල), ගණිතය යන විෂයයන් ඇතුළු විෂයයන් හතරකට (04) සම්මාන සමාර්ථයන් ඇතුළුව විෂයයන් හයක් (06) සමත්වී තිබිය යුතුයි.

**ඒ සමඟ**

අපොස (උ/පෙ) විභාගයෙන් අවම වශයෙන් විෂයයන් එකක් සමත් වී තිබිය යුතුයි. (පොදු විභාගය හැර)

**(ආ) වයස් සීමාව :-**

අයදුම්පත භාරගන්නා අවසන් දිනට අයදුම්කරු වයස අවුරුදු 18 **නොඅඩු හා වයස අවුරුදු 30 නොවැඩි** අයෙකු විය යුතුයි.

05.6 නිර්මාණකරණ සේවය **III** වන ශ්‍රේණියේ තනතුර සඳහා විවෘත තරග විභාගය මගින් බඳවා ගැනීම

**විභාග අංකය - VI**

**(අ) අධ්‍යාපන සුදුසුකම් :-**

අපොස (සා/පෙ) විභාගයෙන් **එකවර** භාෂාව (දෙමළ / සිංහල), ගණිතය යන විෂයයන් ඇතුළු විෂයයන් හතරකට (04) සම්මාන සමාර්ථයන් ඇතුළුව විෂයයන් හයක් (06) සමත්වී තිබිය යුතුයි.

**ඒ සමඟ**

අපොස (උ/පෙ) විභාගයෙන් අවම වශයෙන් විෂයයන් එකක් සමත් වී තිබිය යුතුයි. (පොදු විභාගය හැර)

**(ආ) වෘත්තීය අධ්‍යාපනය / වෘත්තීමය සුදුසුකම් :-**

විවීම් ශිල්පකරණය සම්බන්ධව සම්මාන සමාර්ථයක් සමඟ පේෂකර්ම ගුරු සහතිකයක් ලබා තිබිය යුතුයි. (ඇඟළුම් කර්මාන්ත දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලැබූ වසරක පුහුණු පාඨමාලාව)

**හෝ**

බඳවා ගන්නා අවස්ථාවේදී පවතින පුරප්පාඩුවල ගණනට සුදුසුකම්ලත් අපේක්ෂකයන්ගේ සංඛ්‍යාව අඩුවෙන් දක්නට ලැබේ නම් බඳවා ගැනීමේ අරමුණ උදෙසා පහත සඳහන් පේෂ කර්ම සම්බන්ධ සහතික අතිරේක සුදුසුකම් ලෙස අවධානයට ලක් කරනු ලැබේ.

(i) රජයේ ලලිත කලා ආයතනයකින් ප්‍රදානය කරන ලද ඉහළ තත්ව සහතිකයක්.

(ii) වානිජ පේෂකර්ම ආයතනය විසින්/ කර්මාන්ත කටයුතු දෙපාර්තමේන්තුව විසින් ප්‍රදානය කරන සහතිකයක්.

(iii) පේෂකර්ම මධ්‍යස්ථානයක වසරක විවීම්කරු වශයෙන් සේවය කළ අත්දැකීම් ඇති බවට කර්මාන්ත කටයුතු දෙපාර්තමේන්තුවෙන් ප්‍රදානය කරන ලද සහතියක්.

**(ඇ) වයස් සීමාව :-**

අයදුම්පත භාරගන්නා අවසන් දිනට අයදුම්කරු වයස අවුරුදු **18 නොඅඩු, හා වයස අවුරුදු 30 නොවැඩි** අයෙකු විය යුතුයි.

## 06 බඳවා ගන්නා ක්‍රමය :-

06.1 ලිඛිත පරීක්ෂණය මගින් කුසලතාව මත, බඳවා ගන්නා අවස්ථාවේ ක්‍රියාත්මකව පවතින රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, බඳවා ගන්නා සැලැස්ම, ජාතික හා පළාත් ප්‍රතිපත්ති යනාදීන්ට එකඟව වගුව – **I** හි දක්වා ඇති තනතුරුවලට බඳවා ගනු ලැබේ. මෙම දැන්වීම මගින් කැඳවා ඇති සුදුසුකම් සියල්ල සම්මුඛ පරීක්ෂණයේ දී පරීක්ෂාවට ලක් කරනු ලැබේ. අවශ්‍ය සුදුසුකම් නැති බවට හඳුනාගත් විට මෙම තනතුරු සඳහා ඇති හිමිකම් අහෝසි කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී සියළු සුදුසුකම්,ලියකියවිලි පරීක්ෂාවට ලක් කරනු ලැබේ. මෙහි දී ලකුණු ප්‍රදානය කිරීමක් සිදුනොවේ.

06.2 ඉහත සුදුසුකම් සහිත අයදුම්කරුවන් වෙතින්, ලිඛිත පරීක්ෂණයෙන් සුදුසුකම් ලබන අපෙක්ෂකයන් ලබා ගන්නා සම්පූර්ණ ලකුණු පිළිවෙළ අනුව පවතින පුරප්පාඩු සඳහා පත්වීම් ලබා දීම පිණිස සම්මුඛ පරීක්ෂණයට තෝරාගනු ලැබේ.

06.3 පේෂකර්ම උපදේශක හා කුඩා කර්මාන්ත උපදේශක තනතුරුවලට බඳවා ගන්නා විට, ඉහත තනතුරුවල **පවතින පුරප්පාඩු සංඛ්‍යාව් 30%** නොඉක්මවා සීමිත තරග විභාගය මගින් බඳවා ගන්නා අයදුම්කරුවන්ගෙන් පූර්ණය කරනු ලැබේ.

06.4 පුරප්පාඩුවලින් 03% ක් විශේෂ අවශ්‍යතා ඇති අයදුම්කරුවන් සඳහා (ආබාධිත) වෙන්කරනු ලැබේ. අපේක්ෂකයන් පත්වීම සඳහා තෝරා ගන්නා විට අදාළ තනතුරේ සේවය කිරීමට තම විශේෂිත අවශ්‍යතා තත්වය බාධාවක් නොවන බව විශේෂ වෛද්‍ය පරීක්ෂණය මගින් ඔප්පු කළ යුතුයි.

## 07. විභාග ගාස්තු :-

අපේක්ෂකයන් පදිංචි වී සිටින උතුරු පළාතේ පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක රුපයිල් **500.00** ක් ගෙවා **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත"** ගේ **"3401"** යන ගිණුමට බැර කළ කුවිතාන්සිය අයදුම්පතේ අදාළ කොටුව තුළ නොගැළවෙන සේ අලවා එවිය යුතුයි. මොනම හේතුවක් නිසා හෝ මෙම ගාස්තු නැවත ගෙවනු නොලබන අතර මෙම ගාස්තුව වෙනත් කිසියම විභාගයක් සඳහා මාරු කිරීමට අවසර දෙනු නොලැබේ.

## 08. අයදුම්කරන ක්‍රමය :-

08.1 මෙම දැනවීම අවසානයේ ඇති ආදර්ශ අයදුම්පතට අනුකූලව A4 ප්‍රමාණයේ (21 සෙ.මී x 29 සෙ.මී) කඩදාසියක 1 සිට 10 දක්වා තිබෙන ඡේද පළමු පිටුවේ ද, 11 සිට 14 දක්වා තිබෙන ඡේද දෙවන පිටුවේ ද, ඉතිරි කොටස් අනෙක් පිටුවේ ද ආවරණය වන පරිදි අයදුම්පත සකස් කර ගත යුතුයි. සම්පූර්ණ කරන ලද අයදුම්පත 19.10.2018 වැනි දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන පරිදි, **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත, අංක: 393/48, කෝවිල් වීදිය, නල්ලූර්, යාපනය"** යන ලිපිනයට ලියාපදිංචි තැපැල මඟින් යොමු කළ යුතුයි.

08.2 එක් තරග විභාගයකට අමතරව තරග විභාග සඳහා අයදුම් කිරීමට කැමැත්ත දක්වන අයදුම්කරුවන් එක් එක් තරග විභාග සඳහා වෙන වෙනම අයදුම්පත් සකස් කර යොමු කළ යුතු අතර විභාග ගාස්තු ද එක් එක් තරග විභාග සඳහා වෙන වෙනම ගෙවිය යුතුයි.

08.3 අයදුම්පත / අයදුම්පත් යොමු කරන ලිපිකවරයේ වම් ඉහළ කෙළවරේ **"උතුරු පළාත් රාජ්‍ය සේවයේ කර්මාන්ත කටයුතු දෙපාර්තමේන්තුවට යටතේ ඇති තනතුරට බඳවා ගැනීමේ විවෘත/ සීමිත තරග විභාගය – 2018"** යනුවෙන් සඳහන් කළ යුතුයි. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් හා, අදාළ තොරතුරු සම්පූර්ණ කර නැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

08.4 අයදුම්පතේ ඡායා පිටපත ඔබ බාරයේ තබා ගැනීම ප්‍රයෝජනවත් වන අතර අයදුම්පතේ ඡායා පිටපත් හෝ පූර්ව නිශ්චිත පිටපත් යනාදීන් භාරගනු නොලැබේ. විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍ර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් නිකුත් කරනු ලැබේ. **විභාගය සඳහා ප්‍රවේශපත්‍ර නිකුත් කිරීම යනු අයදුම්කරු විසින් සියළුම සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් සේ නොසැළකිය යුතුයි.**

08.5 අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයදුමකරුවන්ට ප්‍රවේශපත් නිකුත් කළ පසු ඒ පිළිබඳව පුවත්පත් මඟින් දැන්වීමක් නිකුත් කරනු ලැබේ. දැන්වීම පළවූ පසුව කිසියම් අපේක්ෂකයකුහට අවම වශයනේ දින තුනකට (03) ප්‍රථම හෝ විභාගය සඳහා ප්‍රවේශ පත්‍ර ලැබුණේ නැති නම්, ඒ පිළිබඳ පහත සඳහන් තොරතුරු සමග, **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත, අංක: 393/48, කෝවිල් වීදිය, නල්ලූර්, යාපනය"** යන ලිපිනයට දැන්වීමට කටයුතු කළ යුතුයි. (දුරකථන අංකය - 021 221 9939, ෆැක්ස් අංක - 021 221 9940)

**සටහන :-**

ඉල්ලීම් ලිපිය, අයදුම්පත හා විභාග ගාස්තු ගෙවන ලද කුවිතාන්සියේ සහතික කරන ලද පිටපත, ප්‍රවේශපත්‍ර යොමු කිරීම සඳහා ෆැක්ස් අංකයක්.

08.6 විභාගය සඳහා අයදුම් කරන අයදුම්කරුවන්ගේ අයදුම්පත් ලැබුණු බවට කිසිදු දැන්වීමක් නිකුත් කරනු නොලැබේ. තවද අයදුම්පත් අවසාන දිනට ප්‍රථම ඉල්ලා ඇති සුදුසුකම් සම්පූර්ණ කර නැති අයදුම්පත් පෙර දැන්වීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලබන අතර ඒ හා සම්බන්ධ දැන්වීම් කිසිවක් නිකුත් කරනු නොලැබේ.

## 09. අනන්‍යතාවය තහවුරු කිරීම :-

විභාග අපේක්ෂකයන් තමන් පෙනී සිටින සෑම විෂයන්ටම නිරීක්ෂක තෘප්තිමත් වන පරිදි තම අනන්‍යතාවය තහවුරු කළ යුතු බව ඉල්ලා සිටිනු ලැබේ. අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලි වලින් කුමක් හෝ එක් ලියවිල්ලක් පිළිගනු ලැබේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් ප්‍රදානය කරන ලද ජාතික හැඳුනුම් පත
(ii) වලංගු විදේශ ගමන්බලපත්‍රය.

ඉහත සඳහන් කරන ලද ලියවිල්ලක් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන විභාග අපේක්ෂකයෙකුට විභාගය සඳහා පෙනී සිටීමේ හිමිකම ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත, ගේ අභිමතය පරිදි ප්‍රතික්ෂේප කළ හැකිය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් පනවනු ලබන නිමයන්ට විභාග අපේක්ෂකයන් නැඹුරු විය යුතුයි. එම නියමයන් උල්ලංඝනය කළහොත් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් තුමා විසින් පනවනු ලබන දඬුවමට යටත් වීමට සිදුවේ.

## 10. අසත්‍ය තොරතුරු සඳහා දඬුවම :-

අයදුම්පත් සම්පූර්ණ කරන විට ඉතා අවධානයෙන් යුතුව සත්‍ය තොරතුරු ඉදිරිපත් කිරීමට වගබලා ගත යුතුයි. මෙම විභාග නීතිරීති ප්‍රකාර කිසියම් අපේක්ෂකයෙකු විභාගයට ප්‍රථම හෝ විභාගය පැවැත්වෙන විට හෝ විභාගයෙන් පසුව කුමණ අවස්ථාවකදී හෝ වුව ද සුදුසුකම් සම්පූර්ණ කර නැති බවට කුමන අවස්ථාවකදී හෝ තොරතුරු දැන ගැනීමට ලැබුණහොත්, එම අපේක්ෂකයාගේ විභාගයට පෙනී සිටීමේ හිමිකම වහාම ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්කරු විසින් ඉදිරිපත් කර ඇති යම්කිසි තොරතුරක්

අසත්‍ය බවට ඔප්පු වුවහොත් ඕනෑම අවස්ථාවක එම පුද්ගලයා පළාත් රාජ්‍ය සේවයෙන් පහ කිරීමට කටයුතු කළ හැකිය.

## 11. අත්සන සහතික කිරීම :-

**අයදුම්කරුවන් සියළු දෙනාම තම අත්සන සහතික කරවා ගැනීම අත්‍යාවශ්‍ය වේ.** එක් රජයේ ආයතනයක සේවය කරන අයදුම්කරුවෙකු අයදුම් කරන විට අයදුම්කරු තම ආයතන ප්‍රධානියා හෝ ඔහු වෙනුවට අත්සන් කිරීමට බලයලත් නිලධාරියෙකු මගින් තම අත්සන සහතික කරවා ගත යුතුයි. අනෙක් අයදුම්කරුවන් තම ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී සාමවිනිසුරු, දිවුරුම් නිලධාරී, නීතිඥවරයකු, නොතාරිස්, නාවික හමුදා, යුද හමුදා, ගුවන් හමුදාවන්හි සේවයේ නියුතු නියෝගලත් නිලධාරියෙකු, රුපියල් 240,360.00 ට නොඅඩු වටිනාකමක් වාර්ෂික ඒකාබද්ධ වැටුප වශයෙන් ලබන ස්ථිර රජයේ හෝ පළාත් පාලන හෝ පළාත් නිලධාරියෙකු, ආගමික මධ්‍යස්ථානයන් භාරව කටයුතු කරන පූජක පක්ෂයෙන් එක් අයෙකු විසින් සහතික කළ යුතුයි.

## 12. විභාගය සඳහා වන සැලැස්ම :-

### 12.1 පේෂකර්ම උපදේශක III වන ශ්‍රේණියේ තනතුරට විවෘත / සීමිත තරඟ විභාගය මගින් බඳවා ගැනීම

මෙම පරීක්ෂණ ලිඛිත හා වෘත්තීය පරීක්ෂණය යනුවෙන් කොටස් දෙකකින් යුක්තයි ලිඛිත පරීක්ෂණය පහත සඳහන් පරිදි ප්‍රශ්න පත්‍ර දෙකකින් (02) සකස් වී ඇති අතර සිංහල හා දෙමළ යන භාෂා දෙකින්ම පවත්වනු ලැබේ. අයදුම් කරන භාෂාව පසුව වෙනස් කිරීමට අවස්ථාව දෙන්නේ නැත.

**01. ලිඛිත පරීක්ෂණය (විවෘත / සීමිත තරඟ විභාගය)**

| අංක | ප්‍රශ්න පත්‍රය | ප්‍රශ්න පත්‍රයේ අන්තර්ගතය | කාලය | සම්පූර්ණ ලකුණු |
|---|---|---|---|---|
| 01 | විවිම් සම්බන්ධ ගිණුම්කරණය හා පේෂකර්ම සම්බන්ධ සාමාන්‍ය දැනුම | 1. ඇගයිම් සකස් කරන ආකාරය<br>2. වෙලාව ගණනය කිරීම හා වැඩ<br>3. නිෂ්පාදනය – සියළුම ඒකක සම්බන්ධයෙන් වියදම් ඇස්තමේන්තු කිරීම<br>4. දෙනියර්, රෙක්ස්, කපු නූල් යනාදියේ නූල් ගණන් ගැනීම<br>5. නූල්වල සංඛ්‍යාව, පරිසමාප්තය යනාදිය ගණන් ගැනීම<br>6. විවිම් නිෂ්පාදන සම්බන්ධ වැදගත් මූලද්‍රව්‍ය යනාදි<br>7. නූල් සම්බන්ධයෙන් තිබෙන්නාවූ පොදු අවශ්‍යතාවයන් හඳුනාගැනීම.<br>8. ඇලවීම, වර්ණ ගැලවීම, වර්ණගැන්වීම්, සායම් දැමීම යන කාර්යයන් පිළිබඳ දැනුවත්වී සිටීම<br>9. නිෂ්පාදනය කරන ලද ඇඳුම් වර්ග විකුණුම් ක්‍රියාවලිය පිළිබඳ<br>10. ඇඳුම් අත්කර්මාන්ත සම්බන්ධ යන්ත්‍රවල නම් හා එහි භාවිතය සම්බන්ධ දැනුම | පැය 01 | 100 |
| 02. | විවිම් යන්ත්‍ර සම්බන්ධව කෙටුම්පත් හා රෙදි නිෂ්පාදනය පිළිබඳ සැලසුම් කෙටුම්පත් කිරීම | 1. වම්පස චිත්‍රය<br>2. ස්ථාවර මෝස්තර පැති බැලීම ඉදිරිපස<br>3. සැටල් පෙට්ටියේ දිග පළල<br>4. විවිම් නූල් බෝලය මැනීමේ සිතියම මාර්ගෝපදේශ හා හෙක් හා ග්‍රිල්<br>5. පැඩල් පුවරු දෙකකින් තුවා විවීම සම්බන්ධ කෙටුම්පත<br>6. හීල්ස් ඇඟිරීම් ක්‍රමයට සකස් කිරීම<br>7. 2, 4, 6, 8 යන පිළිවෙලින් හීල්ස් ඇඟිරීම් ක්‍රමය සකස් කිරීම | පැය 01 | 100 |

**02. වෘත්තීය පරීක්ෂණය (විවෘත තරඟ විභාගයට)**

| ලකුණු ප්‍රදානය කරන ප්‍රධාන විෂයයන් | කාලය | උපරිම ලකුණු |
|---|---|---|
| **අ). පේෂකර්මය හැසිරවීම**<br>01. නූල හඳුනාගැනීම<br>02. විවිම් නූල හා බහාලුම්<br>03. විවිම් නූල් සකස් කිරීම | මිනිත්තු 30 | 50 |
| **ආ). පේෂකර්මයේ නිරතවීම**<br>01. පැඩල් පුවරුව නියාමනය කිරීම<br>02. පේෂකර්ම ක්‍රියාවලිය | මිනිත්තු 30 | 50 |
| **සම්පූර්ණ** | **පැය 01** | **100** |

**සටහන :-**

පේෂකර්ම උපදේශක III වන ශ්‍රේණිය සඳහා විවෘත තරඟ විභාගය මගින් බඳවා ගැනීම ලිඛිත පරීක්ෂණය හා වෘත්තීය පරීක්ෂණය යනාදියේ සම්පූර්ණ ලකුණු පිළිවෙළ අනුව ක්‍රියාත්මක කරනු ලැබේ.

**12.2 කුඩා අත්කර්මාන්ත III වන ශ්‍රේණියට විවෘත/ සීමිත තරඟ විභාගය මගින් බඳවා ගැනීම**

මෙම පරීක්ෂණයන් ප්‍රශ්න පත්‍ර දෙකකින් (02) යුක්තය. මෙය සිංහල හා දෙමළ යන භාෂාවලින් පැවැත්වීමට නියමිතය. අයදුම් කළ භාෂාව පසුව වෙනස් කිරීමට අවස්ථාව දෙනු නොලැබේ. තනතුරු සියල්ලටම අදාළ විෂය මාලා පහත සඳහන් පරිදි වේ.

| අංක | ප්‍රශ්න පත්‍රය | ප්‍රශ්න පත්‍රයේ අන්තර්ගතය | කාලය | සම්පූර්ණ ලකුණු |
|---|---|---|---|---|
| 01. | සාමාන්‍ය අභියෝග්‍යතාව | මෙම ප්‍රශ්න පත්‍රය තර්කානුකූල පදනම මත වන හැකියාව, විශ්ලේෂණය සඳහා වන බුද්ධිය, තීරණය ගැනීමේ හැකියාව හා අංක ගණිතය සම්බන්ධ දක්ෂතාවය යනාදිය ඇතුළත් අපේක්ෂකයාගේ දැනුමේ හැකියාව පරීක්ෂාවට ලක් කරන ආකාරයට සකස් කර ඇත. | පැය 01 | 100 |
| 02. | සාමාන්‍ය දැනුම | මෙම ප්‍රශ්න පත්‍රය ආර්ථික සංවර්ධන, දේශපාලනය, අධ්‍යාපනය, සංස්කෘතිය, සමාජය, විද්‍යා තොරතුරු, ක්‍රීඩා, කුඩා කර්මාන්ත යන විෂයන් සමඟ දේශීය හා ජාත්‍යන්තර කටයුතු සම්බන්ධ අපේක්ෂකයාගේ දැනුම පරීක්ෂාවට ලක් කිරීමේ ප්‍රශ්න අඩංගු ප්‍රශ්න පත්‍රයකි. | පැය 01 | 100 |

**12.3 අලෙවි කළමණාකරු III වන ශ්‍රේණිය සඳහා විවෘත තරඟ විභාගය මගින් බඳවා ගැනීම**

මෙම පරීක්ෂණ පහත සඳහන් පරිදි ප්‍රශ්න පත්‍ර දෙකකින් (02) සමන්විතයි. මෙය සිංහල හා දෙමළ යන භාෂාවලින් පැවැත්වීමට නියමිතය. අයදුම් කළ භාෂාව පසුව වෙනස් කිරීමට අවස්ථාව දෙනු නොලැබේ. තනතුරු සියල්ලටම අදාළ විෂය මාලා පහත සඳහන් පරිදි වේ.

| අංක | ප්‍රශ්න පත්‍රය | ප්‍රශ්න පත්‍රයේ අන්තර්ගතය | කාලය | සම්පූර්ණ ලකුණු |
|---|---|---|---|---|
| 01. | සාමාන්‍ය අභියෝග්‍යතාව | මෙම ප්‍රශ්න පත්‍රය තර්කානුකූල පදනම මත වන හැකියාව,, විශ්ලේෂණය සඳහා වන බුද්ධිය, තීරණය ගැනීමේ හැකියාව හා අංක ගණිතය සම්බන්ධ දක්ෂතාවය යනාදිය ඇතුළත් අපේක්ෂකයාගේ දැනුමේ හැකියාව පරීක්ෂාවට ලක් කරන ආකාරයට සකස් කර ඇත. | පැය 01 | 100 |
| 02. | සාමාන්‍ය දැනුම | මෙම ප්‍රශ්න පත්‍රය ආර්ථික සංවර්ධන, දේශපාලනය, අධ්‍යාපනය, සංස්කෘතිය, සමාජය, විද්‍යා තොරතුරු, ක්‍රීඩා, කුඩා කර්මාන්ත යන විෂයන් සමඟ දේශීය හා ජාත්‍යන්තර කටයුතු සම්බන්ධ අපේක්ෂකයාගේ දැනුම පරීක්ෂාවට ලක් කිරීමේ ප්‍රශ්න අඩංගු ප්‍රශ්න පත්‍රයකි. | පැය 01 | 100 |

**12.4 නිර්මාණකරණ සේවය III වන ශ්‍රේණිය සඳහා විවෘත තරඟ විභාගය මගින් බඳවා ගැනීම**

මෙම පරීක්ෂණ පහත සඳහන් පරිදි ප්‍රශ්න පත්‍ර තුනකින් (03) සමන්විතය. මෙය සිංහල හා දෙමළ යන භාෂාවලින් පැවැත්වීමට නියමිතයි. අයදුම් කළ භාෂාව පසුව වෙනස් කිරීමට අවස්ථාව දෙනු නොලැබේ. තනතුරට අදාළ විෂය මාලාව පහත සඳහන් පරිදි වේ.

| අංක | ප්‍රශ්න පත්‍රය | ප්‍රශ්න පත්‍රයේ අන්තර්ගතය | කාලය | සම්පූර්ණ ලකුණු |
|---|---|---|---|---|
| 01. | සාමාන්‍ය අභියෝග්‍යතාව | මෙම ප්‍රශ්න පත්‍රය තර්කානුකූල පදනම මත වන හැකියාව,, විශ්ලේෂණය සඳහා වන බුද්ධිය, තීරණය ගැනීමේ හැකියාව හා අංක ගණිතය සම්බන්ධ දක්ෂතාවය යනාදිය ඇතුළත් අපේක්ෂකයාගේ දැනුමේ හැකියාව පරීක්ෂාවට ලක් කරන ආකාරයට සකස් කර ඇත. | පැය 01 | 100 |
| 02. | සාමාන්‍ය දැනුම | මෙම ප්‍රශ්න පත්‍රය ආර්ථික සංවර්ධන, දේශපාලනය, අධ්‍යාපනය, සංස්කෘතිය, සමාජය, විද්‍යා තොරතුරු, ක්‍රීඩා, කුඩා කර්මාන්ත යන විෂයන් සමඟ දේශීය හා ජාත්‍යන්තර කටයුතු සම්බන්ධ අපේක්ෂකයාගේ දැනුම පරීක්ෂාවට ලක් කිරීමේ ප්‍රශ්න අඩංගු ප්‍රශ්න පත්‍රයකි. | පැය 01 | 100 |
| 03. | ප්‍රායෝගික පරීක්ෂණය | මෙම ප්‍රායෝගික පරීක්ෂණය නිර්මාණය කිරීම, චිත්‍ර, වර්ණ ගැළපීම්, ඇඟළුම් කර්මාන්ත ක්ෂේත්‍රයේ නව නිර්මාණ, හස්ත කර්මාන්තයේ නව නිර්මාණ යනාදියේ මූලික දැනුම පරීක්ෂා කිරීමේ ප්‍රශ්න වලින් සමන්විතයි. | පැය 01 | 100 |

**සටහන** :-

මෙම විභාගය තරඟ විභාගයක් වන බැවින් සම්මුඛ පරීක්ෂණයට සුදුසුකම් ලැබීමට සෑම ප්‍රශ්න පත්‍රයකටම වෙන් කරන ලද ලකුණු ප්‍රමාණයෙන් අවම වශයෙන් සියයට හතලිහක් (40%) අපේක්ෂකයා විසින් ලබා ගත යුතුයි. සම්මුඛ පරීක්ෂණයේ දී අයදුම්කරුවන් විසින් මෙම තරඟ විභාගයෙන් ලබා ගන්නා ලද සම්පූර්ණ ලකුණු ප්‍රමාණය කුසලතා අනුපිළිවෙළ (Merit Order) අවධානයට ලක් කරනු ලැබේ.

**13.** අපේක්ෂකයන්ගේ විභාග ප්‍රතිඵල උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් www.np.gov.lk යන උතුරු පළාත් වෙබ් අඩවිය මගින් නිකුත් කරනු ලැබේ. අනතුරුව විභාගයට පෙනී සිටි සෑම අපේක්ෂකයන්ටම තැපැල් මගින් ප්‍රතිඵල යොමු කරනු ලැබේ.

**14.** මෙම විභාගය පැවැත්වීම හෝ අවලංගු කිරීම සම්බන්ධයෙන් සියළුම බලතල උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්තුමා සතුය. දෙමළ හා සිංහල මාධ්‍යයන්ගෙන් පළ වන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ වෙනස්කමක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක දෙමළ මාධ්‍යය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

**15.** මෙම විභාගය හා සම්බන්ධ නිවේදනය www.np.gov.lk යන උතුරු පළාත් වෙබ් අඩවියට පිවිසීමෙන් දැක බලාගත හැකිය.

***අ. සිවබාලසුන්දරන්***
ලේකම් (වැඩබලන),
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු පළාත.
21.09.2018